75554

OL/2010/44-S-I,II

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**44 S I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2010 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2010 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2010

නැටුම් (දේශීය) I,II
நடனம் (சுதேச) I,II
Dancing (Oriental) I,II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

## නැටුම් (දේශීය) I

**විශේෂ උපදෙස් :**

※ සියලු ම අයදුම්කරුවන් **I කොටසේ** ප්‍රශ්න **25** ට ම උත්තර සැපයිය යුතු ය. එයට අමතර ව **II උඩරට** නර්තනය හෝ **III පහතරට** නර්තනය හෝ **IV සබරගමු** නර්තනය යන කොටස් **තුනෙන් එක් කොටසකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

※ **II, III** හා **IV** වන කොටස්වලින් කලවමේ ප්‍රශ්න තෝරා **නොගත යුතු ය.** ඔබ පිළිතුරු සපයන්නේ කුමන කොටසට දැයි උත්තර පත්‍රයේ පැහැදිලි ව ලියා දක්විය යුතු ය.

සැලකිය යුතුයි :

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.

(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

### I කොටස

- අංක **1** සිට **10** තෙක් ප්‍රශ්නවල හිස් තැන්වලට සුදුසු වචන තෝරන්න.

1. "ජේළි සැදී අහනෝ සැරසීලා" මෙම කවිය ගායනය කරනු ලබන්නේ ............ නැටුමේ දී ය.
(1) ගොයම් කැපීමේ (2) කළගෙඩි (3) රබන් (4) ලී කෙළි

2. කොහොඹා කළය සහ කාවඩි නැටුම වැඩි වශයෙන් දැකිය හැකි වන්නේ ............... පෙරහැරේ දී ය.
(1) දළඳ (2) නවම් (3) මිහිඳු (4) කතරගම

3. රත්නපුර සමන් දේවාලයේ පවත්වන සමන් දේවාල පෙරහැරේ දක්නට ලැබෙන සුවිශේෂාංගයක් ලෙස ............. හැඳින් විය හැකි ය.
(1) සොකරි කෝලම (2) මහ බඹා කෝලම (3) නොන්චි කෝලම (4) ජස කෝලම

4. සෙම්බු, කෝලාට්ටම් අයත් වන්නේ ............... ජන නැටුම් වලට ය.
(1) සිංහල (2) මුස්ලිම් (3) ද්‍රවිඩ (4) බටහිර

5. මහනුවර දළඳ පෙරහැරේ දැකිය හැකි .................... නර්තන, ප්‍රධානත ම උඩරට නර්තන අංග ලෙස සැලකේ.
(1) වෙස්, පන්තේරු සහ උඩැක්කි (2) වෙස්, පන්තේරු සහ සළු
(3) වෙස්, වේවැල් සහ ගොයම් (4) හේවිසි, වේවැල් සහ රබන්

6. කුරුණෑගල යුගයට අයත් ............ "ඒ වේදේහ රජුගේ විධානයෙන්" යන පාඨයෙන් පංචාංග තූර්ය නාද පිළිබඳ තොරතුරු දක්වේ.
(1) ථූපවංශයේ (2) මහාවංශයේ (3) සද්ධර්මරත්නාකරයේ (4) සිංහල උම්මග්ග ජාතකයේ

7. නර්තනයක ආහාර්ය අභිනය මනා ලෙස පිළිබිඹු වන්නේ .............. වලිනි.
(1) අංග චලන (2) නාට්‍යමය අවස්ථා (3) රංග වස්ත්‍රාභරණ (4) වේදිකා ආලෝක

[ දෙවැනි පිටුව බලන්න.

8. මහනුවර යුගයේ ප්‍රශස්ති ගායනය කොට ඇතැයි සැලකෙන්නේ .................
 (1) මහුල් මඩුවේ දී ය. (2) හේවිසි මණ්ඩපයේ දී ය.
 (3) කවිකාර මඩුවේ දී ය. (4) දළද මළුවේ දී ය.

9. 'බතේ උපත' සහ 'ග්‍රහ අපලය' යන ඉඟි නළු නිර්මාණය කරන ලද්දේ ........... විසිනි.
 (1) ආචාර්ය චිත්‍රසේන (2) ආචාර්ය පණිභාරත
 (3) බැසිල් මිහිරිපැන්න (4) පිටිගල ජයසේන

10. 'හෙළ ගී මග' හා 'කොහොඹා යක් කංකාරිය සහ සමාජය' යන කෘතීන් ලියා ඇත්තේ ..............
 (1) ඩබ්ලිව්. බී. මකුලොලුව සහ ජේ. ඊ. සේදරමන් ය.
 (2) ඩබ්ලිව්. බී. මකුලොලුව සහ මුදියන්සේ දිසානායක ය.
 (3) ආනන්ද ජයසිංහ සහ ජේ. ඊ. සේදරමන් ය.
 (4) ආනන්ද ජයසිංහ සහ තේජා ගුණවර්ධන ය.

- පහත දැක්වෙන වගුව ඇසුරෙන් අංක **11** සිට **13** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | A | B | C | D |
|---|---|---|---|---|
| 1. | පඩුවස්දෙව් | දෙවොල් | සේරමාන් | සමන්දෙව් |
| 2. | වීරමුණ්ඩදෙව් | සීනිගම | ආතුරයා | ගිරිගරා |
| 3. | කුවේණි අස්න | තෙල්මේ | දේවකෝල්පාඩුව | කාහුල්කුට්ටම් |
| 4 | සළඹ | රතුකුට්ටම් | නෙත්තිමාලය | ජටාව |

11. කොහොඹා කංකාරිය සහ දෙවොල් මඩුවේ උපන් කතාව හා සම්බන්ධ පුද්ගල නාම සඳහන් වන්නේ,
 (1) 1 පේළියේ A තීරුවේ සහ C තීරුවේ ය. (2) 1 පේළියේ B තීරුවේ සහ D තීරුවේ ය.
 (3) 2 පේළියේ C තීරුවේ සහ B තීරුවේ ය. (4) 1 පේළියේ A තීරුවේ සහ B තීරුවේ ය.

12. උඩරට සහ පහතරට ශාන්තිකර්ම හා බැඳි නර්තනාංග සඳහන් වී ඇත්තේ
 (1) 3 පේළියේ B තීරුවේ සහ D තීරුවේ ය. (2) 3 පේළියේ A තීරුවේ සහ C තීරුවේ ය.
 (3) 3 පේළියේ B තීරුවේ සහ C තීරුවේ ය. (4) 3 පේළියේ A තීරුවේ සහ B තීරුවේ ය.

13. නර්තනයේ දී හිසට පළඳින ආභරණ ඇතුළත් ව ඇත්තේ,
 (1) 4 පේළියේ A තීරුවේ සහ B තීරුවේ ය. (2) 4 පේළියේ B තීරුවේ සහ C තීරුවේ ය.
 (3) 4 පේළියේ C තීරුවේ සහ D තීරුවේ ය. (4) 4 පේළියේ A තීරුවේ සහ D තීරුවේ ය.

- අංක **14** සිට **17** තෙක් ඇති ප්‍රශ්නවලට පහත සඳහන් තොරතුරු ඇසුරෙන් පිළිතුරු සපයන්න.

නර්තන තරගාවලියකදී සිසුන් සිව්දෙනකුගෙන් අසන ලද ප්‍රශ්න සහ ඔවුන් ඊට පිළිතුරු ලබා දුන් ආකාරය පහත දක්වේ.

**ප්‍රශ්නය** A දේශීය නර්තන සම්ප්‍රදායයන් අයත් ප්‍රධාන ශාන්තිකර්මයක පුද ලබන දෙවිවරුන් දෙදෙනකු නම් කරන්න.
 B පහතරට වන්නමක් ඉරට්ටියකින් අවසාන වන්නේ නම් උඩරට/සබරගමු වන්නමක් අවසන් කරන්නේ කුමන කොටසකින් ද?
 C 'රන්දද' මුද්‍රා නාට්‍යය නිර්මාණය කළ ශිල්පියා කවු ද?
 D චිත්‍රසේන මහතා විසින් නිර්මාණය කළ මුද්‍රා නාට්‍ය **දෙකක්** නම් කරන්න.

එක් පිළිතුරකට ලකුණු 5 කි.

| නම | A | B | C | D |
|---|---|---|---|---|
| කුමාරි | වීරමුණ්ඩ/කොහඹා | අඩව්ව | ඒ. ඉඹුල්ගොඩ | කරදිය/ශිවරංග |
| මදුමි | පත්තිනි/සමන් | අඩව්ව | එස්. පණිභාරත | විදුර/රාවණ |
| නිලන්ති | දෙවොල්/පත්තිනි | කස්තිරම | ඒ. ඉඹුල්ගොඩ | නලදමයන්ති/රාවණ |
| සම්පත් | වලියකුන්/ගරා | අඩව්ව | ඒ. ඉඹුල්ගොඩ | මිණි සලඹ/බතේ උපත |

14. මෙම තරගයේ දී ලකුණු වැඩි ප්‍රමාණයක් ලබා ගෙන ඇත්තේ කවු ද?
 (1) කුමාරි (2) මදුමි (3) නිලන්ති (4) සම්පත්


15. මදුමිගේ **වැරදි** පිළිතුරු සංඛ්‍යාව කොපමණ ද?
 (1) 2 (2) 3 (3) 4 (4) 5


16. සම්පත්ගේ **නිවැරදි** පිළිතුරු සංඛ්‍යාව කොපමණ ද?
 (1) 4 (2) 3 (3) 2 (4) 1


17. නිලන්ති A ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ කවර සම්ප්‍රදායක් පදනම් කර ගෙන ද?
 (1) පහතරට (2) උඩරට (3) භරත (4) ගැමි නැටුම්

[ තුන්වැනි පිටුව බලන්න.

- අංක 18 සිට 20 තෙක් ප්‍රශ්නවලට පහත දැක්වෙන රූප සටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.


(A)


(B)


(C)

18. A සහ B රූප සටහනෙන් දැක්වෙන භාණ්ඩ වන්නේ,
    (1) පහතරට බෙරය සහ උඩරට බෙරයයි. (2) පහතරට බෙරය සහ දවුලයි.
    (3) ගැටබෙරය සහ පහතරට බෙරයයි. (4) ගැටබෙරය සහ දවුලයි.

19. රූඳ කිට තත් දෙමි සහ දෙං ජිංත ගත දෙංත යන බෙර පදය වැයෙන්නේ, පිළිවෙළින්
    (1) A සහ B වාද්‍ය භාණ්ඩවලිනි. (2) B සහ A වාද්‍ය භාණ්ඩවලිනි.
    (3) A සහ C වාද්‍ය භාණ්ඩවලිනි. (4) B සහ C වාද්‍ය භාණ්ඩවලිනි.

20. වදුරුහම සහ එළුහම යොදා ගැනෙන වාද්‍ය භාණ්ඩ වන්නේ, පිළිවෙළින්
    (1) C සහ B වාද්‍ය භාණ්ඩයි. (2) B සහ C වාද්‍ය භාණ්ඩයි.
    (3) A සහ B වාද්‍ය භාණ්ඩයි. (4) A සහ C වාද්‍ය භාණ්ඩයි.

21. 'භරත නාට්‍යම්' ඉගැන්වීම සඳහා භාරතයේ සුප්‍රසිද්ධ ආයතනය,
    (1) ලක්නව් භාත්ඛන්ඩ විද්‍යාපීඨය ය. (2) කල්කටා ශාන්ති නිකේතනය ය.
    (3) අඩයාර් කලා ක්ෂේත්‍රය ය. (4) කේරළ කලා මණ්ඩලය ය.

22. උත්තර භාරතයේ බිර්ජු මහරාජ් සහ මහාචාර්ය වික්‍රමසිංහ වඩාත් ප්‍රසිද්ධ වූයේ කුමන නර්තන කලාව සඳහා ද?
    (1) භරත නාට්‍යම් (2) මනිපුරි නර්තනය
    (3) කථකලි නර්තනය (4) කථක් නර්තනය

23. මනිපුරි නර්තනය ව්‍යාප්ත කිරීමට මහත් උත්සාහයක් දැරූ තැනැත්තෙකි.
    (1) ශ්‍රීමතී රුක්මණී දේවි අරුන්ඩේල් (2) මහා කවි රබින්ද්‍රනාත් තාගෝර්
    (3) මහා කවි වල්ලතෝල් නාරායනන් මේනන් (4) ශ්‍රීමතී මේනකා

24. කේරළ ප්‍රාන්තයේ ප්‍රභවය ලත් කථකලි නර්තනය, වඩාත් විශේෂත්වයක් ගන්නේ,
    (1) රංග වස්ත්‍රාභරණවලට ය. (2) කිරීටම්වලට ය.
    (3) වේශ නිරූපණයට ය. (4) වෙස් මුහුණුවලට ය.

25. රුසියාවේ බොල්ෂෝයි රඟහලේ වේදිකාගතවූ "හංසවිල" ප්‍රථමයෙන් වේදිකා ගත කරන ලද්දේ,
    (1) 1875 දී ය. (2) 1877 දී ය. (3) 1892 දී ය. (4) 1899 දී ය.

## II කොටස - උඩරට නර්තනය

26. උඩරට නර්තනය වඩාත් ප්‍රචලිත ප්‍රදේශ වන්නේ
    (1) උඩුනුවර සහ දඹදෙණියයි. (2) උඩුනුවර හා බදුල්ලයි.
    (3) සත් කෝරළය සහ සතර කෝරළයයි. (4) සත් කෝරළය සහ තුංකුළු කෝරළයයි.

27. දෙතිතට අයත් වන්නම් දෙකකි.
    (1) තුරඟා සහ සැවුලා (2) කිරලා සහ මයුරා
    (3) තුරඟා සහ වෛරොඩී (4) කිරලා සහ ගජගා

28. බලි ශාන්තිකර්මය හා බැඳි ග්‍රහයින් වේ.
    (1) ඉරු, සිකුරු, විෂ්ණු (2) ඉරු, සිකුරු, බ්‍රහ්ම
    (3) සඳු, කෙහෙතු, අනංග (4) සඳු, කෙහෙතු, සෙනසුරු

29. කුඳ කුජිගත වට්ටමට අයත් අඩව්වක කොටසකි.
(1) ගත්ත තෙහිඟු තකට තකුඳ
(2) තාම් දෙමිති ගත දෙමිකිට
(3) තත්ත තරි තරි තතරි තරි තරි
(4) තත් තරිඟු තත් තකට

30. ආචාර්ය පණිභාරත ගුරින් විසින් නිර්මාණය කරන ලද නර්තන අංග වේ.
(1) පන් නෙලීම සහ සුරඹවල්ලි
(2) ගොයම් කැපීම සහ නාරිලතා
(3) පන් නෙලීම සහ ගිරිදේවි
(4) ගොයම් කැපීම සහ ගිරිදේවි

31. "ඉන්ද්‍රානි උර වාසනේ" මෙය
(1) හටන් කවියකි.
(2) රබන් කවියකි.
(3) වැලපුම් කවියකි.
(4) ප්‍රශස්ති කවියකි.

32. උඩරට වන්නම් 18 ට අමතරව නිර්මාණය වී ඇති වන්නම් දෙකකි.
(1) සමනළ - කිඳුරා
(2) සමනළ - මහ බෝ
(3) කුදිරඩි - සේරා
(4) කුදිරඩි - හංසා

33. "සුරිඳුන් පෙර සිටන් - බලයුත් සවතිඳුන්" මෙම කවියට සුදුසු බෙර පදය වන්නේ
(1) දේං ජිං ජිං තකට දෙංතක
(2) දෙං තකු දෙං ජිං ගත් තත්
(3) දෙං දෙං ජිං - ජිං ගජිගත
(4) දෙම් ජිංත ගත දෙංත

34. තත් තොහ . . . . . . . තක්කඩ තරිකිට තක තොහ . . . . . . . යන අඩව්වේ හිස් තැන් සඳහා නියමිත පද කොටස තෝරන්න.
(1) තක තක - තොහ තක
(2) තොහ තක - තාකුජින්ත
(3) තක තොහ - තකට ජිකට තොහ
(4) තොහ තක - තකතක

35. උඩරට වෙස් ඇඳුම් කට්ටලයේ ඇති ආභරණ කිහිපයකි.
(1) උල්උඩය, දෙවල්ල, රතු කුට්ටම
(2) සිබා බන්ධනය, තෝඩුපත්, පායිම්පත
(3) සිබා බන්ධනය, හහල, රතුරෙද්ද
(4) උල්උඩය, හහල, හැඩකැල්ල

36. "කුං ජිං ජිංතක ජිං තක ජිං කුඳ" යන බෙර පදය ප්‍රස්තාර කළ හැක්කේ
(1) මාත්‍රා 3 තනිතිතට ය.
(2) මාත්‍රා 4 තනිතිතට ය.
(3) මාත්‍රා 2 + 4 දෙතිතට ය.
(4) මාත්‍රා 3 + 4 දෙතිතට ය.

37. උඩරට නර්තනයේ දී පමණක් භාවිත වන වචන වන්නේ
(1) ආවැන්දුම, කෝල්පාඩුව, කොතල පදය
(2) ආවැන්දුම, දේව කෝල්පාඩුව, අඩව්ව
(3) යක් ඇනුම, දුනුමාලප්පුව, මඩු පේ කිරීම
(4) කුවේණි අස්න, දුනුමාලප්පුව, කොහොඹා හැල්ල

38. කොහොඹා කංකාරියේ අන්තර්ගත නාට්‍යමය පෙළපාළි වේ.
(1) ගුරුගේ මාලාව, යක්කම් පහ සහ ගබඩා කොල්ලය
(2) ගුරුගේ මාලාව, යක්කම් පහ සහ ඌරු දනය
(3) ආවැන්දුම, යක්කම් පහ සහ වැදි දනය
(4) ආවැන්දුම, යක්කම් පහ සහ වැදි යකුන් නැටීම

39. කොහොඹා කංකාරියේ එන ගායන විධි ලෙස සැලකේ.
(1) මල් මඩුපූරය, මුවමල විදීම
(2) අයිලේ යැදීම, හහලේ යැදීම
(3) කඩවර කවි, සිරස පාද කවි
(4) මල් යහන් කවි, ඇඹුම් කවි

40. අද්‍යතන ජන මාධ්‍ය නිර්මාණවල බෙහෙවින් දක්නට ලැබෙන්නේ
(1) විවිධ හස්ත මුද්‍රාවලින් යුත් නර්තනයන් ය.
(2) සාම්ප්‍රදායික රංග වස්ත්‍ර යොද ගත් නර්තන අංගයන් ය.
(3) ශාන්තිකර්ම හා බැඳි වාදන අවස්ථාවන් ය.
(4) ගීත අනුව නිර්මාණය වූ විචිත්‍ර නර්තන අංගයන් ය.

[ පස්වැනි පිටුව බලන්න.

## III කොටස - පහතරට නර්තනය

26. පහතරට නර්තනය වඩාත් ප්‍රචලිත ප්‍රදේශ වන්නේ
(1) රයිගම, බණ්ඩාරගම (2) මාතර, කොළඹ (3) මාතර, බෙන්තර (4) බෙන්තර, බදුල්ල

27. දෙතිතට අයත් සිංදු වන්නම් දෙකකි.
(1) නළුගීතිකා තාලය, නාතිලිංචි තාලය (2) ශුද්ධ තාලය, හනුමන්තා තාලය
(3) නළුගීතිකා තාලය, හනුමන්තා තාලය (4) ශුද්ධ තාලය, අනුරාගදණ්ඩ තාලය

28. බලි ශාන්තිකර්මය හා බැඳී ග්‍රහයින් වේ.
(1) ඉරු, සිකුරු, විෂ්ණු (2) ඉරු, සිකුරු, බ්‍රහ්ම
(3) සඳු, කෙහෙතු, අනංග (4) සඳු, කෙහෙතු, සෙනසුරු

29. ගුඳ ගති ගත වට්ටමට අයත් ඉරට්ටියක කොටසකි.
(1) ගුංදත් ගුහිහිගදිරිකිට ගත ගත ගහිහිගතම් (2) ගුංද ගුද ගතිගත ගත්ත ගදිත ගත
(3) ගුං ගුද දෙං - දෙං ගතිතම් (4) ගතිත දෙදෙං දෙංගතිතම්

30. කේ. එස්. ප්‍රනාන්දු විසින් නිර්මාණය කරන ලද නර්තන අංග වේ.
(1) ගිරිදේවී, පන් නෙළීම (2) ගිරිදේවී, සුරඹවල්ලිය
(3) ගිරිදේවී, ගෙජ්ජි මාත්‍රය (4) තේලමේ, සුරඹවල්ලිය

31. "දැතින් පන්දු ගෙන - අහසට දමා අල්ලන" . . . . මෙය
(1) හටන් කවියකි. (2) රබන් කවියකි. (3) වැලපුම් කවියකි. (4) සුරඹවල්ලි කවියකි.

32. පහතරට සිංදු වන්නම් දෙකකි.
(1) නාතිලිංචි සහ මණ්ඩුක (2) නළුගීතිකා සහ ලලිතරාග
(3) නාතිලිංචි සහ ගංගාදි (4) නළුගීතිකා සහ මහමේඝ

33. "සත රකිනේ අත් අතුසොඳිනේ දිලි රන් තලිනේ තව පලු විලසේ" මෙම කවියට සුදුසු බෙර පදය වන්නේ
(1) රෙගුදගත තත් දෙං ගදිකිට (2) රෙගුඳගතත් දෙගතත් ගතිකිට
(3) ගතිකිට ගත දෙමි ගුදිකිට ගත දෙමි (4) දෙමි තමි ගත ගදිතමි ගත

34. දෙමිත . . . . . . ගුං දිමිගත ගත්තත් . . . . . . යන ඉරට්ටියේ හිස් තැන් සඳහා නියමිත පද කොටස තෝරන්න.
(1) ගතං - ගුං ගුං දිත් දිත් (2) ගත්ත - ගත්ත ගුගුද
(3) ගතං - ගද්දිත ගත ගත් (4) ගත්ත - ගද්දිත ගත ගත

35. පහතරට තෙල්මේ ඇඳුම් කට්ටලයේ ඇති ආභරණ කිහිපයකි.
(1) පබළු කරමාලය, සිලම්බු, සේලය (2) පබළු කරමාලය, තලල් පටිය, පබළු ඉණ පටිය
(3) පබළු හැට්ටය, කාහුල්, රහු (4) පබළු හැට්ටය, මේස් කලිසම, රහු

36. "ගතිකිට ගත දෙමි - ගුදි කිට ගත දෙමි" යන බෙර පදය ප්‍රස්තාර කළ හැක්කේ
(1) මාත්‍රා 3 තනිතිතට ය. (2) මාත්‍රා 4 තනිතිතට ය.
(3) මාත්‍රා 2 + 4 දෙතිතට ය. (4) මාත්‍රා 3 + 4 දෙතිතට ය.

37. පහතරට නර්තනයේ දී පමණක් භාවිත වන වචන වන්නේ
(1) තෙල්මේ, කොතල පදය, මඩු බැසීම (2) තෙල්මේ, පන්දම් පාළිය, දෙවොල් නැටීම
(3) දෙවොල් නැටීම, කෝල්පාඩුව, නඩන්දුව (4) වඩිග පටුන, ඉරට්ටිය, නඩන්දුව

38. දෙවොල් මඩුවේ අන්තර්ගත නාට්‍යමය පෙළපාලි වේ.
(1) අඹ විදමන, දෙවොල් ගොඩබැසීම, දෙළහ පෙළපාළිය
(2) අඹ විදමන, සූනියම් යක්ෂණිය අවතාරය, මරුසන්නිය
(3) දෙවොල් ගොඩබැසීම, දෙළහ පෙළපාළිය, මරුසන්නිය
(4) දෙවොල් ගොඩබැසීම, යක්කම්, දෙළහ පාළිය

39. දෙවොල් මඩුවේ එන ගායන විධි ලෙස සැලකෙන්නේ
(1) මල් මඩුපුරය, තොරන් යාගය (2) බිසෝ කප සිටුවීම, තොරන් යාගය
(3) මල්යහන් කවි, ඇඹුම් කවි (4) කඩවර කවි, සිරස පාද කවි

40. අද්‍යතන ජනමාධ්‍ය නිර්මාණවල බෙහෙවින් දක්නට ලැබෙන්නේ
(1) විවිධ හස්ත මුද්‍රාවලින් යුත් නර්තනයන් ය.
(2) සාම්ප්‍රදායික රංග වස්ත්‍ර යොද ගත් නර්තන අංගයන් ය.
(3) ශාන්තිකර්ම හා බැඳී වාදන අවස්ථාවන් ය.
(4) ගීත අනුව නිර්මාණය වූ විචිත්‍ර නර්තන අංගයන් ය.

[ හයවැනි පිටුව බලන්න.

## IV කොටස - සබරගමු නර්තනය

26. සබරගමු නර්තනය වඩාත් ප්‍රචලිත ප්‍රදේශ වන්නේ
    (1) බලංගොඩ, හාරිස්පත්තුව (2) බලංගොඩ, මාතර
    (3) බලංගොඩ, රත්නපුරය (4) රත්නපුරය, සීතිගම

27. දෙතිතට අයත් වන්නම් දෙකකි.
    (1) කුදිරඩි සහ සැවුලා (2) කුදිරඩි සහ අනිලා
    (3) සැවුලා සහ කදම්භ පක්ෂි (4) කදම්භ පක්ෂි සහ කොවුලා

28. බලි ශාන්තිකර්මය හා බැඳි ග්‍රහයින් වේ.
    (1) ඉරු, සිකුරු, විෂ්ණු (2) ඉරු, සිකුරු, බ්‍රහ්ම
    (3) සඳු, කෙහෙතු, අනංග (4) සඳු, කෙහෙතු, සෙනසුරු

29. පට්ටුතාල මාත්‍රයට අයත් කලාසම කොටසකි.
    (1) ජිංත ගත ගත ගකිත කුඳ /// (2) තහර් රුදගත් ගත කුඳ ගත් ගකි කිට
    (3) තදෙමි මිත්තෙයි දෙං දෙමිත්තෙයි (4) ජිංත තකට දිරිකිට තරිකිට ගත

30. ආචාර්ය එස්. පණිභාරත ගුරින් විසින් නිර්මාණය කරන ලද නර්තන අංග වේ.
    (1) පන් නෙලීම සහ සුරඹවල්ලිය (2) ගොයම් කැපීම සහ නාරිලතා
    (3) පන් නෙලීම සහ ගිරිදේවි (4) ගොයම් කැපීම සහ ගිරිදේවි

31. "උපන්නේ දළුමුර නාග ලොව" - මෙය
    (1) නාග වන්නමේ කවියකි. (2) මල් මඩුපුරයේ කවියකි.
    (3) කෝල්මුර කවියකි. (4) හත්පද පෙළපාළි කවියකි.

32. සබරගමු වන්නම් පෙළට අයත් වන්නම් කිහිපයකි.
    (1) කිඳුරා - සමනළ (2) කුදිරඩි - විරාඩි (3) සේරා - පත්තිනි (4) කුදිරඩි - ඊරඩි

33. "සත් පුත් ලෙස උතුම් පුත් පුත් පිරි රදුන්" මෙම කවියට සුදුසු බෙර පදය වන්නේ
    (1) ජිං ජිමිකිට ජිමිකිට තත් (2) කුඳිත ගතිත ගතගත කුඳ
    (3) ජිං ජිමිකිට තත් කිටිතක (4) ගතිත ගතිත ගතගත කුඳ

34. ගත්ත . . . . . . දෙංගඩ තරිකිට . . . . . . යන අඩව්වේ හිස් තැන් සඳහා නියමිත පද කොටස තෝරන්න.
    (1) ගදිත - ගදිගත (2) ගදිත ගත - ගදිත ගත
    (3) කුදිත්තක් - ජිත්තත් (4) කුදිත්තත් - තස්කඩ ජික්කඩ

35. සබරගමු පබළු ඇඳුම් කට්ටලයේ ඇති ආභරණ කිහිපයකි.
    (1) නෙත්ති මාලය, හගල, රතු රෙද්ද (2) කඩුක්කන්, කරපටිය, නෙත්තිමාලය
    (3) කඩුක්කන්, කරපටිය, රතු රෙද්ද (4) නෙත්ති මාලය, හගල, කයිමෙත්ත

36. "ජිමිත කුඳ දෙමි" යන බෙර පදය ප්‍රස්තාර කළ හැක්කේ
    (1) මාත්‍රා 3 තනිතිතට ය. (2) මාත්‍රා 4 තනිතිතට ය.
    (3) මාත්‍රා 2 + 4 දෙතිතට ය. (3) මාත්‍රා 3 + 4 දෙතිතට ය.

37. සබරගමු නර්තනයේ දී පමණක් භාවිත වන වචන වන්නේ
    (1) හත්පද පෙළපාළිය, තෙල්මේ නැටීම, මුදුන් තාලය
    (2) හත්පද පෙළපාළිය, යහන් දක්ම, පන්දම් පද
    (3) දේව කෝල්පාඩුව, තෙල්මේ නැටීම, මල් මඩුපුරය
    (4) දේව කෝල්පාඩුව, මුදුන්තාලය, මල් මඩුපුරය

38. දෙවොල් මඩුවේ අන්තර්ගත නාට්‍යමය පෙළපාළි වේ.
    (1) රාමා යක්කම, පොත්කඩේ යක්කම, අඹ විදමන (2) රාමා යක්කම, අසුර යක්කම, මරු සන්නිය
    (3) පොත්කඩේ යක්කම, අඹ විදමන, දෙවොල් පද (4) යහන් දක්ම, දෙවොල් නැටීම, මරු සන්නිය

39. පහන් මඩුවේ ගායන විධි ලෙස සැලකේ
    (1) මල් මඩුපුරය, තොරන් යාගය (2) බිසෝ කප සිටුවීම, තොරන් යාගය
    (3) මල්යහන් කවි, ඇඹුම් කවි (4) කඩවර කවි, සිරපාද කවි

40. අද්‍යතන ජනමාධ්‍ය නිර්මාණවල බෙහෙවින් දක්නට ලැබෙන්නේ
    (1) විවිධ හස්ත මුද්‍රා වලින් යුත් නර්තනයන් ය.
    (2) සාම්ප්‍රදායික රංග වස්ත්‍ර යොදගත් නර්තනයන් ය.
    (3) ශාන්තිකර්ම හා බැඳි වාදන අවස්ථාවන් ය.
    (4) ගීත අනුව නිර්මාණය වූ විචිත්‍ර නර්තන අංගයන් ය.

* *

/ හත්වැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

**44 | S | I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2010 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2010 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2010

නැටුම් (දේශීය) I,II
நடனம் (சுதேச) I,II
Dancing (Oriental) I,II

## නැටුම් (දේශීය) II

※ **පළමු වන** ප්‍රශ්නය අනිවාර්ය වේ.
※ **පළමු වන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

---

1. සියලු ම ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.
   (i) තුං තුඹ ගෙඩි තුනයි තුනයි - තිත්ත කැකිරි දෙකයි දෙකයි
   මෙම රබන් පදය ...................................... තනි තිතට වාදනය කළ හැකි ය.
   (ii) ග්‍රහ පන්ති, ඇඹුම් කවි, කඩතුරා කවි, හිං හතරේ කවි මේවා සුවිශේෂව ගායනය කරනු ලබන්නේ ........... ශාන්තිකර්මයේ දී ය.
   (iii) සැළලිහිණිය, පරෙවිය, දියවන්නාව ..................... විසින් නිර්මාණය කළ ශ්‍රී ලාංකේය මුද්‍රානාට්‍ය වේ.
   (iv) ශ්‍රී වීරපරාක්‍රමබාහු රජතුමාට ..................... කළ බව සිහබා අස්නේ සඳහන් වේ.
   (v) දෙවුන්දර දේවාලයේ හින්දු බාලිකාවන් පන්සියක් නර්තනයේ යෙදුන බව .,................ වාර්තාවලින් හෙළි වේ.
   (vi) 19 වන සියවසේ අග භාගයේ චෛකොව්ස්කි සංගීතවත් කළ වඩාත් ප්‍රසිද්ධියට පත් රුසියානු බැලේ නාට්‍යය කුමක් ද?
   (vii) පුංග් නමැති අවනද්ධ වාද්‍ය භාණ්ඩය වාදනය කරන්නේ කුමන භාරතීය සම්ප්‍රදයේ ද?
   (viii) ශාන්තිකර්ම සැරසිලිවලදී කොළ වර්ණය මතු කර දක්වීම සඳහා ගන්නා අමුද්‍රව්‍යයක් නම් කරන්න.
   (ix) මාත්‍රා පහේ නැටුම් අයත් වන දේශීය නර්තන සම්ප්‍රදායයන් **දෙක** ලියන්න.
   (x) සොකරි ජන නාටකයේ අන්තර්ගත ප්‍රධාන චරිත **දෙකක්** සඳහන් කරන්න.

2. මාත්‍රා 4 තනි තිතට අයත් වන්නමක / සින්දු වන්නමක පහත සඳහන් අංග ප්‍රස්තාර කරන්න.
   (i) බෙර පදයක් / දවුල් පදයක්
   (ii) කවි පදයක්
   (iii) කස්තිරම / ඉරට්ටිය / කලාසම

3. උඩරට, පහතරට, සබරගමු යන දේශීය ශාන්තිකර්ම ගත් කළ ශාස්ත්‍රීය නර්තනාංග රැසකින් පෝෂණය වූවකි.
   (i) කොහොඹා කංකාරියේ ශාස්ත්‍රීය නර්තනාංග **දෙකක්** පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.
   (ii) තෙල්මේ සහ දෙවොල් නැටීම් පහතරට ශාන්තිකර්මයක් ඇසුරෙන් සාකච්ඡා කරන්න.
   (iii) ඉහත පාඨය ඇසුරෙන් සබරගමු සම්ප්‍රදයයේ ශාන්තිකර්මයක නර්තනාංග **දෙකක්** පිළිබඳ විමසන්න.

4. පහත සඳහන් මාතෘකාවලින් **තුනක්** පිළිබඳ කෙටි සටහන් ලියන්න.
   (i) ආදේශ භාණ්ඩ
   (ii) තල හා අවකාශය
   (iii) ප්‍රකාශනාත්මක චලන
   (iv) පංචතූර්ය භාණ්ඩ
   (v) ආහාර්ය අභිනය

[ අටවැනි පිටුව බලන්න.

5. කෝලම් නාටකය ඇසුරෙන් පහත සඳහන් කරුණු සාකච්ඡා කරන්න.
   (i) රංග භූමිය හා නර්තන විධි
   (ii) වෙස් ගැන්වීම හා රංග වස්ත්‍ර
   (iii) චරිතවලින් ඉස්මතු වන උපහාසය

6. විජයාවතරණයේ සිට වර්තමානය දක්වා ම, ශ්‍රී ලංකාවේ නර්තන කලාව ක්‍රම ක්‍රමයෙන් ප්‍රවර්ධනය වී ඇති බව සාහිත්‍යගත තොරතුරු මගින් ගම්‍ය වේ.
   (i) අනුරාධපුර යුගයෙන් ලැබෙන ලිඛිත සාධක **දෙකක්** ගෙන එකල නර්තනය සමාජය සමග සම්බන්ධ වූ ආකාරය පිළිබඳ විමසීමක් කරන්න.
   (ii) ඇසළ පෙරහැර මංගල්‍යය පැවැත්වීමේ හේතුවෙන්, නර්තනය ව්‍යාප්ත වූ බවට කරුණු දක්වන්න.
   (iii) අද්‍යතනයේ දේශීය නර්තනය නවීකරණය වී ඇති ආකාරය නිදසුන් දෙමින් පරීක්ෂා කරන්න.

7. පහත දක්වෙන රූප සටහන් පරීක්ෂා කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


(1)


(2)


(3)


(4)

   (i) අංක 4 රූපයේ දක්වෙන නර්තන සම්ප්‍රදාය කුමක් ද? චරිත **දෙක** නම් කරන්න.
   (ii) භරත නාට්‍යම් නර්තනය දක්වා ඇත්තේ කුමන අංකය සහිත රූපයෙන් ද? එහි දක්වෙන රංග වස්ත්‍රාභරණ තුනක් ලියන්න.
   (iii) අංක 2 හා 3 රූපවල ඇති නර්තන සම්ප්‍රදායන් පිළිබඳ විස්තරයක් කරන්න.

※ ※ ※